# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරනලදී.

**අංක. 9,687—1947ක්වූ අප්‍රේල් මස 2 වෙනි දිනවූ බදාදා.**

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දඹරාවේ සුසානභූමියක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" පස්වෙනි කාණ්ඩයේ කාරනිබන්ධන සංකාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ බලය පිට පලාත් පාලක විධායක මණ්ඩලයෙන් නිසිආකාරෙ මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 1,162. ගම—දඹරාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වහලගහකොටුව නොහොත් රත්නායක මුදියන්සෙලාගේවත්ත | මුඩුබිම .. | (1) ආ. ම්. ජී. ආන්ච්රීදී, දෙරගමුව, වත්තේගම, (2) ඩී. ඩී ජීවර්ඩ්, නො. 14, ත්‍රිකුණාමලේ වීදිය, මහනුවර, අයිතිවාසිකම් දෙන්වයි | 0 0 22·7 |
| 2 | වහලගහකොටුව .. | .. තේක්කවත්ත . | ඩී. ඩී. ජීවර්ඩ්, නො. 14, ත්‍රිකුණාමලේ වීදිය, මහනුවර | 0 1 33·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා සයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

61——J. N. A 70490—32 (3/47)

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ගේ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය මේ 1947ක්වූ මැයි මස 12වෙනි දින පෙරවරු 11යේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි ආන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ ප්‍රකාරතුරැත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1947ක්වූ මාර්තු මස 27වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

එච්. සී. ගුණවර්ධන,
මහනුවර උප ඒජන්ත වම්හ.

———

මේ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:— ගුරුකෙල්ලේගේදර අමුණෙන් සිට කුඹුරුවලට වතුරදීම පිණිස වාරිමාර්ගයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීමේ ක්‍රියාකරණ පිණිස "මේ 1876වෙනි ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" කියාමින් කාණ්ඩයේ ධාරතිබෙන පංචාතිතුවල ප්‍රකාරයට ආණ්ඩුකාරවරයන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

පිහිටුමේ නො. 204. ගම—කතෝගම.

| නො. | ඉඩමේ නම. | අත්දම. | අයිතිකාරයින්ගේ නා. | මහත අ. රූ. ප. |
| --- | --- | --- | --- | --- |
| 60 | කගටකඩමුකලාගේ බැදවත්ත .. | වත්ත .. | වීරසේකර අප්පුහාමි .. | .. 0 0 8·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්මී සඳහා හත්වෙනි වගන්තියේ ප්‍රකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනාම තමුන්ගේ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරන අය මේ 1947ක්වූ අප්‍රේල් මස 29වෙනි දින උදේ 10යේ කනිසමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි ආකාරමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ ප්‍රකාරතුරැත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

මේ 1947ක්වූ මාර්තු මස 25වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ඇම්. ජේ. පී. සැන්ඩිස්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## සුප්‍රීම් උසාවියේ දැන්වීම.

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශ කරන්නේනම් දකුණු දිසාවේ ක්‍රිම්නෙල් නඩු විභාගය මේ 1947ක්වූ අප්‍රේල් මස 25වෙනි දින පෙරවරු 11 පැය පටන් ගාල්ලේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත.—එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඩබ්ලිව්. පී. දළුවත්ත,
ඩෙපියුටි පිස්කල් වම්හ.

මේ 1947ක්වූ මාර්තු මස 24වෙනි දින
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රීම් උසාවියෙන් මට ලැබී තිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශ කරන්නේනම්, මාතර දිසාවේ ක්‍රිම්නෙල් නඩු විභාගය මේ 1947ක්වූ අප්‍රේල් මස 25වෙනි දින පෙරවරු 11 පැය පටන් ගාල්ලේ තිබෙන නඩුශාලාවේ පවත්වන්ට යෙදෙනවා ඇත.—එහි යම් කාරණ ඇතුව සිටින සැමදෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීසිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුසුදුසුවන් බවත් මෙයින් සැමදෙනාටම දන්වන්නෙමි.

ඇම්. රාජපක්ෂ,
ඩෙපියුටි පිස්කල් වම්හ.

මේ 1947ක්වූ මාර්තු මස 24වෙනි දින
මාතර ඩෙපියුටි පිස්කල් කන්තෝරුවේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.